# දේශප්‍රේමී බෞද්ධ අධ්‍යාපනඥයා
# ඇල්. එච්. මෙත්තානන්ද මහතා



උදර "පුද්ගලයකු"ගේ මහ මෙහෙය අනුස්මරණය කිරීමෙන් සිදුවන වැඩ බෙහෙවි. අතීතයක දැනුම ඔස්සේ ගුණගරුක, බුද්ධිමත්, ශිෂ්ට සම්පන්න පුරවැසියාගෙන් බබළන උත්තරීතර සමාජයක් සඳහා අඩිතාලමක් දමා ගැනීමට පශ්චිම ජනතාවට ඉඩ ප්‍රස්තා ලැබීම එහි ලා ප්‍රධාන කරුණක් වෙයි. කිසියම් දැයක මුතුන් මිත්තන් ගේ කිතුගොස ඒ දැයේ දරුමුණුපුරන් හට දල්වන ලද මිණි පහනක් බවට පත්වන්නේ මේ නිසා ය.

මෙවන් සිරිමත් හැඟුමක පිහිටා, මෙවන් ජාතික වීර දිනයක සිහිපත් කළ යුතු උදර පුරුෂයන් අතුරෙන් ඇල්. එච්. මෙත්තානන්දයෝ ද ඉදිරි පෙළ අසුනක මැ හෙබෙති.

සිංහල බෞද්ධ අධ්‍යාපනය නංවාලීමෙහි ලා උදර මහ මෙහෙයක් කළ මෙත්තානන්දයන් ගේ ජන්ම ලාභය සිදුවී ඇත්තේ දකුණු ලක අම්බලන්ගොඩ දී ය. දිනය ක්‍රි: ව: 1894 මාරතු මස 19 වැනි ද ය. ඔවුන් ගේ පියාණන් දැ ලොකු-සාතු හේවා කොවිස් ද සිල්වා නම් වූ දැ ය. මෑණියෝ වීරසූරිය කරලිනාහාමි නම් වූ.

ගාල්ලේ රිච්මන්ඩ්කන්ද විද්‍යාලයෙන් ලද ද්විතීයික අධ්‍යාපනයෙන් පසු මෙත්තානන්දයෝ හිමින් සීරුවේ ස්වකීය පරාර්ථකාමී ජීවිතයට අඩිතාලම දැමූහ. මානව ශාස්ත්‍ර ධර්ම හා ලතින් භාෂාව පිළිබඳ මනා දැනුමක් ඔවුන් කෙරෙහි විය. ලතින් වීරයන් හා ග්‍රීක දර්ශනය පිළිබඳ ව ලද දැනුම් සම්භාරයෙන් ඔවුන් ප්‍රයෝජන ගත්තේ සිංහල බෞද්ධ දරුවන් උදර පුරුෂයන් බවට පත් කරවීමෙහි ස්ථිරසාර පදනමක් සේ එය වහල් කොට ගැනීමෙනි. ආනන්ද විද්‍යාල ඉතිහාසයේ කැපී පෙනෙන විදුහල්පතිවරයකු වීමට ඔවුන් භාග්‍යය ලද්දේ ද එයිනි.

මේ සීමත්හු ආනන්දීය ශිෂ්‍යයන් ශ්‍රේෂ්ට පුරවැසියන් බවට පත්කරවීමට හැකි සෑම පියවරක් ම ගත්තා පමණක් නො ව ඒවා සාර්ථක අයුරින් ක්‍රියාත්මක කොට විශිෂ්ට ප්‍රතිඵල ද ලබා දුන්නාහ.

මෙත්තානන්දයන් කොළඹ ආනන්ද විද්‍යාලයේ විදුහල්පති වශයෙන් පත් ව ආවේ 1945 වර්ෂයේ දී ය. එතෙක් කාලය ඔවුන් ගේ ප්‍රතිසංස්කරණවාදී යුගය විය. පසු යුගය ඔවුන් ගේ විප්ලවවාදී යුගය විය.

ක්‍රි:ව: 1934 දී බෞද්ධ සම්මේලනයේ සභාපති වශයෙන් ඔහු ත්‍රිපිටක භාරකාර අරමුදලක් පිහිටුවා-ලූහ. එයට එවකට තුරුණු වියේ පසුවූ ඩඩ්ලි සේනානායකයන් හා ජේ. ආර්. ජයවර්ධනයන් සහාය කරගන්නට ද ඔහු සමත් වූහ. ත්‍රිපිටක පරිවර්තනය සඳහා මහාචාර්ය ජී.පී. මලලසේකර-යන් ගේ සහාය ද ලැබිණි.

1954 වර්ෂයේ දී ආනන්දයේ විදුහල්පතිපදවියෙන් විශ්‍රාම ගත් මෙත්තානන්දයෝ, සිය කාලය තවදුරටත් ජාතික හා ආගමික සේවා වෙනුවෙන් කැප කරන්නට වූහ. 1956 වර්ෂයේ දී මෙරට සිදුවූ දේශපාලනමය හා සංස්කෘතික පරිවර්තන-යෙහි ලා මෙත්තානන්දයන් අතින් ද භාරදූර කාර්ය භාරයෙක් ඉටුවී තිබිණි. ඒ සම්බන්ධයෙන් කැරුණු සැලකිල්ලක් වශයෙන් ඔවුනට බණ්ඩාරනායක රජයෙන් බුරුම රටේ තානාපති පදවිය පිරිනැමිණි. ඔහු එය ප්‍රතික්ෂෙප කළහ. එය දේශපාලන කැරවි අලයකැයි සිතූ මෙත්තා-නන්දයෝ එහි ලා අශ්ව ප්‍රතිපත්තියට වඩා සිංහ ප්‍රතිපත්තිය මැ රැක ගත්හ.

බෞද්ධ අධ්‍යාපනය සම්බන්ධයෙන් පමණක් නො ව මෙරට කාලීන සමාජ වේදනාවන් සම්-බන්ධයෙන් ද පිළියම් ලැබෙන තෙක් සටන් කිරීම ඔවුන් ගේ විනෝදාංශය විය. කිසි දු භේදයකින් තොර ව අදත් පොදු ජනතාව, 1967.01.11 වැනි දින අපෙන් සදහට ම වෙන් වූ මෙත්තානන්දයන් සිහි කරන්නේ, ඔවුන්ගේ උදර මෙහෙය හා බැඳි කිත් නමට ශීර්ෂ ප්‍රණාමය කරන්නේ, වීර පුරුෂයන් අතර වුව ද සැබෑ වීර පුරුෂයන් දුලබ වන බවට ඔවුන් හොඳාකාර ව ම දන්නා බැවිනි.

---

අනුග්‍රහය: එච්. කේ. සුමතිපාල මහතා